
# කරුණාවන්ත යාළුවා



ඩිනාරා මෙත්සන්දි බණ්ඩාර

# කරුණාවන්ත යාළුවා

ඩිනාරා මෙත්සන්දි බණ්ඩාර

# කරුණාවන්ත යාළුවා

**කතෘ**

ඩිනාරා මෙත්සන්දි බණ්ඩාර

**කතෘගේ ප්‍රථම කෘතිය**

| | |
|---|---|
| පාසල | : මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | : 3 - A |
| කෘතිය පළකරන දිනය | : 2026-05-10 |

ISBN : 978-624-208-955-3

# පිදුම

මාගේ ආදරණීය

අම්මාට හා අප්පච්චිටත්

මාගේ ආදරණීය මහමායා මෑණියන්ටත්

නැණ නුවන ලබාදෙන ගුරුවරුන්ටත්

ආදරෙන්, ගෞරවයෙන් පුද කරමි.



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂත, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයක් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක වන ලේඛිකාවක් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබාදීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සම්දු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10




එකමත් එක රටක පුංචි ලස්සන කැලෑවක

කූඹි රංචුවක් හිටියා.

මේ පුංචි කූඹි රංචුව ඉන්නේ ගුල් වලයි.

ඉතිං මේ යාළුවෝ ටික කෑම සොයාගෙන එන්න

කැලේ මැද්දට ගියා.



ඔහොම ටික ටික කැලේ මැද්දට යනකොට

එක පාරටම වැස්සක් වහින්න පටන් ගත්තා.

ඉතිං මේ යාළුවෝ සේරම

එහෙ මෙහෙ දුවන්න පටන් ගත්තා.

එයාලා තෙමෙන්නේ නැති තැන් වලට වෙලා

වැස්ස පායනකන් හිටියා.

වැස්ස නතර වෙලා

අව්ව හොඳට වැටෙනකන් ඉඳලා

ආපහු කෑම හොයන්න පිටත් වුණා.

ඉතිං ඔය අතර කුඹි යාළුවෙක්


රංචුවෙන් මඟ ඇරුණා.

මේ යාළුවා හොඳටම අඬන්න පටන් ගත්තා.



කූඹී යාළුවා අඬන සද්දේ ඇහිලා

පුංචි ගොළුබෙලි යාළුවෙක් එතනට ආවා.



අනේ ඇයි ඔයා අඬන්නේ

ගොළුබෙල්ලා ඇහුවා.


මගේ යාළුවෝ සේරම දෙනා

මාව දාලා ගිහිල්ලනේ.

දැන් කොහොමද මං ගෙදර යන්නේ ?

හරි මං ගෙදර සොයා ගන්න
ඔයාට උදව් කරන්නම්.
ගොළුබෙලි යාළුවා කිව්වා.

ස්තූතියි යාළුවේ.
ඔයා නම් හරිම කරුණාවන්තයි.



ඉතිං මේ යාළුවෝ දෙන්නා කැලේ මැද්දට ගියා.


කූඹී යාළුවාගේ ගෙදර සොයා ගන්න.

කැලෑ මැද්දට ටික ටික යනකොට

කට්ටියක් කතා කරන සද්දේ ඈතින් ඇහුණා.

ඔන්න ඉතිං කිට්ටු කරලා බලනකොට

කූඹි රංචුව හිටියා.



අනේ ඉතිං හරිම සතුටින් කූඹි යාළුවා

යාළුවෝ ළඟට දුවගෙන ගියා.

කූඹි යාළුවෝ ඔක්කොම ගොඩක් සතුටු වුණා.

අපි ගොඩක් දුකින් හිටියෙ ඔයා නැතුව.

මාත් මගේ යාළුවෝ නැතුව දුකින් හිටියෙ.

ඒත් මේ ඉන්න ගොළුබෙලි යාළුවා තමා

මට උදව් කළේ.

මෙයා ගොඩක්

කරුණාවන්ත හොඳ යාළුවෙක් කියලා

කූඹි යාළුවා අනෙක් කූඹින්ට සතුටින් කිව්වා.

ගොළුබෙලි යාළුවාගෙන් අපිට ඉගෙන ගන්න

හම්බුණු පාඩම තමයි

කරදරේක වැටුණ කෙනෙකුට උදව් කිරීම

හොඳ පුරුද්දක් බව”.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දායට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරි වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරවකට අනාගත ලෝකයේ පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පෙතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයතක් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්තවෙමු.

සෙනෙවිරත්න මහලේකම්<br>
(ව්‍යාපෘති නිර්මාතෘ)